වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2021

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2021

ANNUAL PERFORMANCE REPORT 2021



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
DEPARTMENT OF CENSUS AND STATISTICS
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංක 252

පී .එම් .පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්

2021 ஆண்டுக்கான வருடாந்த செயலாற்றுகை அறிக்கை
தொகைமதிப்பு,புள்ளிவிபரத் திணைக்களம்
செலவின தலைப்பு இல.252

பீ.எம்.பீ.அனுர குமார
பணிப்பாளர் நாயகம்

Annual Performance Report for 2021
Department of Census and Statistics
Expenditure Head No. 252

P.M.P. Anura Kumara
Director General

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යාති පිළියෙල කරනු ලබන ප්‍රධාන ආයතනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. විවිධ සංගණන හා සමීක්ෂණ මගින් එක් රැස් කොට පිළියෙල කරනු ලබන දත්ත සහ දර්ශකාංක, ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රතිපත්ති සම්පාදනයට, ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට මෙන්ම රටේ ආර්ථික සහ සමාජීය වශයෙන් කාලීනව සිදුවන වෙනස්කම් අධ්‍යයනය කිරීමට මෙන්ම රටවල් අතර ආර්ථික සහ සමාජීය තොරතුරු සංසන්දනය කිරීමටද, පර්යේෂණ ආයතන, අධ්‍යාපන ආයතන, මාධ්‍ය ආයතන හා විවිධ පුද්ගලයින් විසින් විවිධ අවශ්‍යතා සඳහා මෙම තොරතුරු භාවිතා කරනු ලබයි.

නිල සංඛ්‍යාති පිළියෙල කිරීමට අමතරව, සංඛ්‍යාන සේවය අවශ්‍ය වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංඛ්‍යාන උපදෙස් සේවාව ලබා දීමද දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

රට තුල පැවැති කොවිඩ් වසංගත තත්ත්වය යටතේ වුවද සංඛ්‍යාලේඛන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තූතිය පුද කරන අතර, දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන කාර්යයන් සඳහා දත්ත ලබා දීම මගින් සහ නන් අයුරින් සහයෝගය ලබා දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන සහ මහජනතාවට මාගේ ස්තූතිය පුද කරමි.



පී. එම්.පී. අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල.
2022 ජුනි
දුරකථන අංකය : +94 11 2147001
ෆැක්ස් : +94 11 2147011
විද්‍යුත් ලිපිනය : dgcensus@statistics.gov.lk
වෙබ් අඩවිය : www.statistics.gov.lk

பணிப்பாளர் நாயகம் அவர்களின் செய்தி

இலங்கையில் உத்தியோகபூர்வ புள்ளிவிபரங்களை தொகுப்பதற்கான முதன்மை நிறுவனம் தொகைமதிப்பு,புள்ளிவிபரத் திணைக்களம் ஆகும். பல்வேறுபட்ட தொகைமதிப்புகள் மற்றும் அளவீடுகள் மூலம் சேகரிக்கப்பட்டு தயாரிக்கப்படுகின்ற தரவுகள் மற்றும் குறிகாட்டிகள் என்பன, அரசாங்க கொள்கைகளை தொகுப்பதற்கும், எதிர்கால அபிவிருத்தி நிகழ்ச்சித்திட்டங்களை திட்டமிடுவதற்கும், நாட்டின் பொருளாதார, சமூக ரீதியாக காலத்துக்கேற்ப ஏற்படும் மாற்றங்களை ஆராய்வதற்கும் அதேபோன்று நாடுகளுக்கு இடையிலான பொருளாதார, சமூக தகவல்களை ஒப்பீடு செய்வதற்கும் பிரதானமாக பயன்படுத்தப்படுகின்றன. அத்துடன் இத்தகவல்கள், ஆராய்ச்சி நிறுவனங்கள், கல்வி நிறுவனங்கள், ஊடக நிறுவனங்கள் மற்றும் பல்வேறு நபர்கள் பல்வேறு தேவைகளுக்காக பெரும்பாலும் பயன்படுத்தப்படுகின்றன.

உத்தியோகபூர்வ புள்ளிவிபரங்களை தயாரிப்பதற்கு மேலதிகமாக இத்திணைக்களம் புள்ளிவிபர சேவை தேவைப்படுகின்ற பல்வேறு அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்கள் பொருட்டு பயிற்சித்திட்டங்களை நடாத்துவதுடன் புள்ளிவிபர உசாவுகை சேவையையும் வழங்குகிறது.

நாட்டில் நிலவிய கொவிட்-19 தொற்றுநோய் நிலமையிலும் கூட புள்ளிவிபர பணிகளை தொடர்ந்து நிறைவேற்றுவதன் மூலம் 2021 ஆம் ஆண்டில் திணைக்களத்தின் எதிர்பார்த்த இலக்குகளை எய்துவதற்கு பொறுப்புடனும் அர்ப்பணத்துடனும் ஒத்துழைப்பு வழங்கிய திணைக்கள பதவியினருக்கு எனது மனமார்ந்த நன்றியை தெரிவிப்பதுடன், திணைக்களத்தின் புள்ளிவிபர செயற்பாடுகள் பொருட்டு தரவுகளை வழங்குவதன் மூலமும் பலவிதமாக ஒத்துழைப்பு வழங்கிய அரசாங்க, தனியார், பிற நிறுவனங்கள் மற்றும் பொது மக்களுக்கும் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கிறேன்.



பீ.எம்.பீ.அனுர குமார
பணிப்பாயர் நாயகம்
தொகைமதிப்பு, புள்ளிவிபரத் திணைக்களம்
“சங்கியான மந்திரய”
இல.306/71, பொல்துவ வீதி
பத்தரமுல்ல
2022 ஜூன்
தொலைபேசி இல : +94 11 2147001
தொலைநகல் : +94 11 2147011
மின்னஞ்சல் : dgcensus@statistics.gov.lk
இணையதளம் : www.statisics.gov.lk

MESSAGE FROM THE DIRECTOR GENERAL

Department of Census and Statistics is the leading agency for compilation of official statistics in Sri Lanka. Most of the data and indicators compiled from various Censuses and Surveys are used primarily to formulate government policies, to plan future development programs, and to study economic and social changes over time in the country, as well as to compare economic and social information between countries throughout the world. This information is mostly used by educational institutions, media institutions and various individuals for different purposes as well.

In addition to preparing official statistics, the department also conducts training programs and provides statistical consultation services to various governmental and non-governmental organizations those who require statistical services.

My sincere thanks to our department staff for their immense support to achieve the desired targets of the year 2021 by continuing the statistical work even in the face of the COVID - 19 pandemic in the country, by providing data for the statistical work of the Department and in many other ways. I also would like to thank the Government, private and other institutions and also the general public for their kind support.



P.M.P.Anura Kumara
Director General
Department of Census and Statistics
“Sankyana Mandiraya”
No: 306/71, Polduwa Road,
Battaramulla.
June 2022
Tele.No. +94 11 2147001
Fax : +94 11 2147011
Email address : dgcensus@statistics.gov.lk
Website : www.statistics.gov.lk

අන්තර්ගතය

		පිටුව
පරිච්ඡේදය 01	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	05
පරිච්ඡේදය 02	ප්‍රගතිය හා ඉදිරිදැක්ම	10
පරිච්ඡේදය 03	වසරේ මූල්‍ය කාර්ය සාධනය.	12
පරිච්ඡේදය 04	කාර්යය සාධන දර්ශක	28
පරිච්ඡේදය 05	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය	50
පරිච්ඡේදය 06	මානව සම්පත් පැතිකඩ	50
පරිච්ඡේදය 07	අනුකූලතා වාර්තාව	55

	பொருளடக்கம்	**பக்கம**
அத்தியாயம் 01	நிறுவனத்தின் விவரம் நிறைவேற்றுபொழிப்பு	65
அத்தியாயம் 02	முன்னேற்றம் மற்றும் எதிர்கால கண்ணோட்டம்	71
அத்தியாயம் 03	வருடத்திற்கான ஒட்டுமொத்த நிதிச் செயலாற்றுகை	73
அத்தியாயம் 04	செயலாற்றுகைச் சுட்டிகள	89
அத்தியாயம் 05	நிலைபேறான அபிவிருத்தி இலக்குகள் (ளுனுபு) அடைவதற்கான செயலாற்றுகை	110
அத்தியாயம் 06	மனிதவள விபரமஅத்தியாயம	110
அத்தியாயம் 07	இணக்கஅறிக்கை	116

	Contents	**Page**
Chapter 01	Institutional Profile/Executive Summary	129
Chapter 02	Progress and the Future Outlook	134
Chapter 03	Overall Financial Performance for the Year	136
Chapter 04	Performance indicators	153
Chapter 05	Performance of the achieving Sustainable Development Goals (SDG)	174
Chapter 06	Human Resource Profile	174
Chapter 07	Compliance Report	179

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත සැපයීම සඳහා වූ වගකීම් දරණ මධ්‍යම රජයේ ආයතනයක් වේ. තවද, ශිෂ්‍යයන්ගේ සිට ජාත්‍යන්තරය දක්වා දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලුම සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් සපුරාලනු ලැබේ. තිරසාර සංවර්ධන ඉලක්ක ඇතුළු රටේ අනෙකුත් සමාජ ආර්ථික තත්ත්ව අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ පදනම්ව ආර්ථිකයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන, නිවැරදිව, විශ්වාසදායක ලෙස හා කාලෝචිතව එක්රැස් කිරීම, සම්පාදනය කිරීම හා බෙදාහැරීමට අවශ්‍ය කටයුතු ඉටුකර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

1.3 ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් සාරාංශ වශයෙන් පහත දැක්වේ.

1. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ
    - ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය වසර දහයකට වරක් පවත්වනු ලබන අතර ඒ අනුව මීලඟ සංගණනය 2021 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කරන ලදී. එසේ වුවද, ශ්‍රී ලංකාවේ මෙන්ම ගෝලීයව ද පවතින කෝවිඩ්-19 වසංගත තත්ත්වය සැලසුම් කටයුතු වලට ඇති කරන ලද බලපෑම හේතුවෙන් ජන හා නිවාස සංගණනය 2022 හා 2023 වර්ෂ වලදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙම වර්ෂයේ දී සංගණනය සඳහා අවශ්‍ය සිතියම් සකස් කිරීමේ කාර්යය අවසන් කිරීමට හැකි විය. එමෙන්ම ලැයිස්තුගත කිරීමේ අදියරෙහි ක්ෂේත්‍ර කටයුතු 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සැලසුම් කරමින් පවතී. මෙවර සංගණනයේ තොරතුරු රැස් කිරීම ටැබ්ලට් පරිගණක ආධාරයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු මෙම වර්ෂයේ දී අවසන් කරන ලදී.
    - ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමේ අරමුණෙන් 2020 වර්ෂයේ දී ග්‍රාම නිලධාරී කොට්ඨාස පිළිබඳ මූලික තොරතුරු රැස් කරන ලද අතර එම තොරතුරු පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් අවසන් වාර්තා නිකුත් කිරීම ආරම්භ කරන ලදී.

2. රට තුල සමාජ ආර්ථික දත්ත එක් රැස් කිරීම (සාර්ව ආර්ථික දර්ශක) සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු,
   - ශ්‍රී ලංකාව සඳහා දළ දේශීය නිෂ්පාදිතය, ආර්ථික වර්ධන වේගය ඇතුළු සාර්ව ආර්ථික දර්ශක සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
   - රටේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට අදාළ දර්ශක සකස් කිරීමට අදාළ කටයුතු සිදුකිරීම.

3. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු
4. දේශීය හා විදේශීය දත්ත භාවිතා කරන්නන්ගේ දත්ත ඉල්ලීම්වලට අනුව අවශ්‍ය දත්ත සකස්කර ලබාදීමේ කටයුතු
   - මෙහිදී දෙපාර්තමේන්තුව මගින් විවිධ සංගණන හා සමීක්ෂණ මගින් රැස්කර ඇති සංඛ්‍යානමය තොරතුරු දෙපාර්තමේන්තුවේ දත්ත ලබාදීමේ ප්‍රතිපත්තියට අනුව සකස් කර ලබාදීම සිදුවේ. එහිදී අදාළ තොරතුරුවල රහස්‍යභාවය සුරැකෙන අයුරින් එම කටයුතු සිදුකිරීම

1.4 සංවිධාන සටහන (ඇමුණුම 01)

මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයකින් හා දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන අංශ සමුහයකින් සමන්විතවේ.

ප්‍රධාන කාර්යාලයේ අංශ හා ඒකක

ප්‍රධාන කාර්යාලයේ පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15ක් සහ විශේෂ ඒකක 03ක් මගින් 2021 වසර තුළ අදාළ කාර්යයන් මෙහෙයවන ලදි. ප්‍රධාන කාර්යාලය අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වන අතර එම අංශය මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු විගණනය කර සමහර ගැටළු සහිත අවස්ථාවලදී අදාළ විසඳුම් ලබාදෙමින් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

තාක්ෂණික අංශ

1	වන අංශය	ජන සංගණන හා ප්‍රජා විද්‍යා
2	වන අංශය	කර්මාන්ත ,ඉදිකිරීම් ,වෙළඳ හා සේවා
3	වන අංශය	කෘෂිකර්ම හා පාරිසරික
4	වන අංශය	ජාතික ගිණුම්
5	වන අංශය	ප්‍රකාශන
6	වන අංශය	පුස්තකාල හා ප්‍රලේඛන
7	වන අංශය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
8	වන අංශය	ආයතනික හා ගිණුම්
9	වන අංශය	නියැදි සමීක්ෂණ
10	වන අංශය	මුද්‍රණ
11	වන අංශය	ක්ෂේත්‍ර කළමනාකරණ
12	වන අංශය	පුහුණු
15	වන අංශය	පර්යේෂණ හා විශේෂ අධ්‍යයන
16	වන අංශය	මිල හා වේතන
18	වන අංශය	සිතියම් විද්‍යා

විශේෂ ඒකක

දත්ත නිකුත් කිරීමේ ඒකකය
අන්තර්ජාතික සංඛ්‍යාලේඛන ඒකකය
තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය

දිවයින පුරා පිහිටි සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල

ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා කාර්යාලවල, දෙපාර්තමේන්තුවට අයත් සංඛ්‍යාලේඛන අංශ පිහිටුවා ඇති අතර දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 335ට අනුයුක්තව සංඛ්‍යාලේඛන නිලධාරීන් සේවය කරයි. තවද මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම පිහිටි කාර්යාලයක් ද වේ.

මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටි සංඛ්‍යාලේඛන අංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ භාරයේ පවතින අතර එම නිලධාරියාට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාරවරුන්, සංවර්ධන නිලධාරිවරුන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් කිහිපදෙනෙක් අනුයුක්ත කොට ඇත. එක් එක් දිස්ත්‍රික්කය තුල දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන හා අනෙකුත් දත්ත රැස්කිරීමේ කටයුතු මෙම කාර්යාල මගින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුල හා ප්‍රධාන කාර්යාලය අතර සංඛ්‍යාලේඛන කටයුතු පිලිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේ ද මෙම දිස්ත්‍රික් කාර්යාල මගිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන නිලධාරි හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන් විසින් ක්ෂේත්‍රයේ දත්ත රැස්කිරීම සිදුකරයි.

මීට අමතරව විවිධ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ තුල සංඛ්‍යාලේඛන අංශයක් ස්ථාපිත කර ඇති අතර දිවයින පුරා මෙවැනි ශාඛා කාර්යාල 57 ක් පවත්වාගෙන යයි. මෙම සංඛ්‍යාලේඛන අංශ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛන නිලධාරි/ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී. සංඛ්‍යාලේඛන අංශය පිහිටි ආයතනයේ රාජකාරි සඳහා අවශ්‍ය සංඛ්‍යාලේඛන රැස්කිරීම, සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම මෙම ශාඛා කාර්යාල මගින් සිදුවේ. ප්‍රධාන කාර්යාලය හා අදාළ ආයතන අතර සංඛ්‍යාලේඛන කටයුතු පිලිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම කාර්යාල මගිනි.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

අදාළ නැත.

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

අදාළ නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රු. 000

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාලසීමාව
19 වන ජාත්‍යන්තර සංඛ්‍යාලේඛනඥවරුන්ගේ සම්මේලනයේදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වූ නියමු අධ්‍යයනය	ලෝක බැංකුව	252-1-1-23-2507 (13)	37,000	2018 ජනවාරි-2023 දෙසැම්බර්
ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය ළමයින් පිලිබඳ තොරතුරු ලබාගැනීමට මොඩියුලයක් ඇතුලත් කිරීම	UNICEF	252-1-1-24-2507 (13)	8,754	2019 ජුනි-2021 දෙසැම්බර්
පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ගෘහස්ථ අධ්‍යයනය	UNICEF	252-1-1-25-2507 (13)	19,800	2020 දෙසැම්බර්-2022 දෙසැම්බර්
වැඩිහිටියන්ගේ දුම්කොළ භාවිතය පිළිබඳ සමීක්ෂණය	ලෝක සෞඛ්‍ය සංවිධානය	252-1-1-26-2507 (13)	33,505	2018 අප්‍රේල්-2022 දෙසැම්බර්
ව්‍යාපාර ස්පන්දන සමීක්ෂණය	ලෝක බැංකුව	252-1-1-27-2507 (13)	5,000	2021/04/20 - 2021/07/15
ආසියානු සහ පැසිෆික් ජාත්‍යන්තර සන්සන්දනාත්මක වැඩසටහන	ආසියානු සංවර්ධන බැංකුව	252-1-1-05-2507 (13)	8,000	2021 පෙබරවාරි-2022 මාර්තු
ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන (8-2507-16/13)	UNFPA	252-1-1-8-2507-16/13	2,512	2021ජනවාරි - 2021 දෙසැම්බර්
ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණයට (HIES) ආහාර අනාරක්ෂිත අත්දැකීම් පරිමාණ (FIES) මොඩියුලය ඇතුළත් කිරීම	ලෝක ආහාර වැඩසටහන	237-1-2-2-2202	3,400	2019 ජුනි-2021 නොවැම්බර්

වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් කරන ලද විදේශ ආධාර ලබන ව්‍යාපෘති

රු. ,000

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	වැය විෂය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම	ව්‍යාපෘති කාල සීමාව

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

පසුගිය වසර තුල දෙපාර්තමේන්තුව ලැබූ විශේෂ ජයග්‍රහණ රාශියකි. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- තිරසාර සංවර්ධන දර්ශක (SDG) කිහිපයක් අලුතින් ගණනය කිරීමට හැකිවීම හා තවත් දර්ශක කිහිපයක් ගණනය කිරීමට අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි කිහිපයක් (Modules) දෙපාර්තමේන්තුව මගින් සිදුකරන සමීක්ෂණවලට එකතුකර ක්ෂේත්‍රයේ අදාළ දත්ත රැස්කිරීම සිදුකිරීම.
- නව තාක්ෂණය භාවිතා කරමින් සංගණනය සඳහා අවශ්‍ය සිතියම් සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සහ ජන හා නිවාස සංගණනය 2023හි සැලසුම් කටයුතු සිදු කිරීම.
- සමීක්ෂණ වල තොරතුරු රැස් කිරීම නව තාක්ෂණය භාවිතයෙන් සිදුකිරීම.
- පරිශීලකයින්ගේ පහසුව පිණිස දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.
- මිළ දර්ශක ඇතුළු අනෙකුත් සංඛ්‍යාති කෝවිඩ් වසංගත තත්ත්වය යටතේ වුවද නියමිත දිනවලට ප්‍රකාශයට පත්කිරීම.
- විශේෂ දත්ත අවශ්‍යතා අනුව සමීක්ෂණ කිහිපයක් ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට සිදුකිරීම.
- දෙපාර්තමේන්තුව මගින් දත්ත ප්‍රකාශයට පත්කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම.
- මාසිකව නිකුත් කරනු ලබන දර්ශකයක් වන නිෂ්පාදකයාගේ මිල දර්ශකයෙහි පාද වර්ෂය වෙනස් කිරීම ඇතුළු වැඩි දියුණු කිරීම් සිදු කිරීම.
- දෙපාර්මේන්තු ඉතිහාසයේ ප්‍රථම වරට සැමට දත්ත යන සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්මේන්තුව විසින් සකස් කරනු ලබන නිල සංඛ්‍යාති පිළිබඳව දෘෂ්‍යාබාධිත පුද්ගලයින්හට අවබෝධයක් ලබා දීමේ අරමුණෙන් බ්‍රේල් සහ විශාලනය කරන ලද අකුරු සහිත ප්‍රකාශනයක් නිකුත් තිරීම.
- විවිධ පුද්ගලික දත්ත ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් (පර්යේෂණ හා රටේ සංවර්ධනයට අවශ්‍ය දත්ත ඉල්ලීම් හැර) රු. මිලියන 1.76 ක ආදායමක් ලබාගැනීමට හැකිවීම.
- දෙපාර්තමේන්තුව තුල වර්ෂ කිහිපයක සිට පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු රාශියක් සම්පූර්ණ කිරීමට අදාළ පියවර ගැනීම.

දෙපාර්තමේන්තුවේ අදාළ කටයුතු සිදු කිරීමේදී මුහුණ දීමට සිදුවූ අභියෝග කිහිපයකි.

- කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දිගින් දිගටම නොවිසඳී පවතින ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු හා අනෙකුත් ගැටළු.
- කෝවිඩ් වසංගත තත්ත්වය යටතේ වෙළඳ පොලෙහි ඇති වූ විචලතාවයන් හේතුවෙන් ජන හා නිවාස සංගණනය 2023 සිදුකිරීම සඳහා අවශ්‍ය ටැබ්ලට් පරිගණක ඇතුළු අනෙකුත් මිලදී ගැනීම් සම්බන්ධව මුහුණ දීමට සිදු වූ අභියෝග.

දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව මුහුණ දීමට සිදුවන අභියෝග ජයගනිමින් පහත සඳහන් ඉදිරි ඉලක්ක කරා ළඟාවීමට අප බලාපොරොත්තු වේ.

- ජන හා නිවාස සංගණනය 2023 හි ලැයිස්තුගත කිරීමේ කටයුතු 2022 වර්ෂයේ පළමුවන කාර්තුවේ දී ආරම්භ කිරීම සහ නියමිත කාල රාමුව තුල සංගණනය සාර්ථකව සිදුකිරීම.

- දෙපාර්තමේන්තුවේ සහ විවිධ ආයතනවල පිහිටි සංඛ්‍යාලේඛන අංශවල පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම.

- පාස්කු ප්‍රහාරය හේතුවෙන් කල් දැමීමට සිදුවූ සමීක්ෂණ සිදු කිරීම.

- ජාතික සංඛ්‍යාලේඛන පද්ධතිය සමාලෝචන කිරීමේ වාර්තාවෙහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කරමින් ජාතික සංඛ්‍යාලේඛන පද්ධතිය ශක්තිමත් කිරීම.

පරිච්ඡේදය 03 - වසරේ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය



ඒකීය-රුපියල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	සමාගම		
			2021	2020	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	වද්‍රිය සංස්ථාව හා ගෙවිය යුතු බදු	2	-	-	ඒකීය-1
-	ආයතනගත වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා ගෙවීමන්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	සංක්‍රමණයෙන් අලුත්		1,067,023,332	950,679,193	ඒකීය-3
-	තැන්පතු		31,633,411	55,280,168	ඒකීය-4
-	ණයකරුගේ බිල්පත්		46,677,350	35,927,679	ඒකීය-5
	ගෙවීමන් ලබාගත් බිල්පත් ලැබීම්		55,214,269	59,772,491	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,200,548,362**	**1,101,659,531**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,200,548,362**	**1,101,659,531**	
	සංක්‍රමණයෙන්ට සල්ලාභ (ඇ)		**1,582,882**	**4,557,874**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,198,965,480**	**1,097,101,657**	
	අඩු කළා : වියදම්				
-	**ප්‍රතාරවර්තන වියදම්**		-	-	
836,600,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	795,339,534	791,010,674	
229,400,000.00	ඒකාබද්ධ සංස්ථාව සහ සේවය	6	141,306,291	172,318,487	ඒකීය-2(ii)
14,000,000.00	ආහාරවේල්, ප්‍රදාන සහ මිරිකුම්මිරි	7	9,854,448	12,105,105	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රතාරවර්තන වියදම්	9	-	-	
1,080,000,000.00	**මුළු ප්‍රතාරවර්තන වියදම් (ඊ)**		**946,500,273**	**975,434,266**	
	මූලධන වියදම්				
21,750,000.00	මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා ඊවිඩිලුතු කිරීම්	10	9,538,521	5,168,369	
75,100,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,369,688	7,655,493	
-	ප්‍රග්‍රහිත මිරිකුම්මිරි	12		-	ඒකීය-2(ii)
-	මූලධ වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
8,507,600.00	තැනීගත වර්ධනය	14	3,622,208	3,980,216	
1,890,877,400.00	වෙනත් මූලධන වියදම්	15	177,577,867	79,497,379	
1,996,235,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**195,108,284**	**96,301,457**	
	තැන්පතු ගෙවීම්		24,200,234	59,378,102	ඒකීය-4
	ණයකරුගේ ගෙවීම්		57,093,814	14,956,665	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ගෙවත් බිල්පත් ගෙවීම්		-	-	
	ප්‍රධාන ගෙවත් වියදම් (උ)		**81,294,048**	**74,334,767**	
	මුළු වියදම් ච = (ඊ+උ+උ)		**1,222,902,605**	**1,146,070,490**	
-	**දෙසැම්බර් 31 දිනට හේෂය ඒ = (ඉ-ච)**		**(23,937,125)**	**(48,968,833)**	
	අලුත් තැනුම් ප්‍රතාරය අනුව හේෂය		(23,937,125)	(48,968,833)	ඒකීය-7
	දෙසැම්බර් 31 දිනට ඉතිරි හේෂය		1,486,732	4,557,874	ඒකීය-3
			(22,450,393)	(44,410,959)	

3.3 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒඩිද-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
මූලික තොරතුරු වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඩිද-6	3,051,162,591	2,942,400,491
මූල්‍ය වත්කම්			
ආයෝජනවල ගිණුම්	ඒඩිද-5/5(අ)	107,999,748	97,583,284
මුදල් හා මුදල් සමාන ද	ඒඩිද-3	1,486,732	4,557,874
මුළු වත්කම්		**3,160,649,071**	**3,044,541,649**
සුද්ධ වත්කම් / අරමුදල			
ආරක්ෂිතාගාර සටහන සුද්ධ වත්කම්		92,168,026	89,184,739
දේපළ පිරියත හා උපකරණ සංවීතය		3,051,162,591	2,942,400,491
කුලී හා වැඩ අත්පිනාගම් සංවීතය	ඒඩිද-5(ඇ)		
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒඩිද-4	15,831,722	8,398,545
ලබිය යුතුය	ඒඩිද-3	1,486,732	4,557,874
මුළු වගකීම්		**3,160,649,071**	**3,044,541,649**

පිටු අංක.....07.... හිට ...34..... දක්වා ඒඩිද් 1 සිට ඒඩිද් 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .....35.... හිට 50 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් පුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙනි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ ඒකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් හිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාදිපති නිලධාරි	ගණකාදිපති නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමිසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : ව. පී. කේ. අනුර පැලටය	ප්‍රීතිමත්: අනුර කුමාර	දිනය ඩී. පී. ඒමලසේන 2022-03-25
අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ රජයේ	ප්‍රධාන මූදල් නිලධාරි
ආර්ථික ප්‍රතිපත්ති සහ	"සම්පතා මන්දිරය"	ප්‍රජාලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සැලසුම් ඛියාත්මක කිරීම් අමාත්‍යාංශය	අංකය: 306/71, පොල්දූව පාර,	අංක: 306/71, පොල්දූව පාර,
	බත්තරමුල්ල.	බත්තරමුල්ල.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒකීය-ශ්‍රී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සමාගම	
	2021 රු.	නැවත ඉදිපත කළ 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුල් බදු ලැබීම්	-	-
සත්කු, අධිභාර, දඩමුදල් සහ බිලපතු	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් කිරීම් වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	55,214,269	59,772,491
අලිමි ලැබීම්	1,067,023,332	950,679,193
දෙපාර්තමේ අයකර ගැනීම්	48,894,208	35,636,219
තැන්පතු ලැබීම්	31,633,411	55,280,168
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,202,765,220	1,101,368,071
අඩුකළා : මුදල් වැය කිරීම්		
ප්‍රද්ගල පරිහරි හා මෙහෙයුම් වියදම්	906,182,078	920,650,616
සහනාධාර සහ ආධාරකිරීම්	9,854,448	12,105,105
වෙනත් වැය කිරීම් වෙනුවෙන් දරන ලද වියදම්	11,686,088	6,282,707
භාණ්ඩාගාරයට පියවන ලද අලිමි	1,582,882	4,557,874
දෙපාර්තමේ ගෙවීම්	57,103,954	14,975,920
තැන්පතු ගෙවීම්	24,200,234	59,378,102
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,010,609,664	1,017,950,324
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)-(අ)-(ආ)	192,155,556	83,417,747
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
මිලීකම් ඉවත්වීමේ ප්‍රතිලාභ හා වෙනත් වත්කම් විකිණීම්	-	-
උරුමය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
වෙනත් වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	192,155,556	83,417,747
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඈ)	192,155,556	83,417,747
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඉ)=(ඇ)-(ඈ)	(192,155,556)	(83,417,747)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අ) + (ඉ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ලැබීම්	-	-
විදේශීය ණය ලැබීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	0

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (අප දෙපාර්තමේන්තුවට අදාල නොවේ)

රු.000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදයම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,080,000	1,080,000	946,500	88
ප්‍රාග්ධන	1,971,850	1,996,235	195,108	9.8

3.8 මු.රෙ. 208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. , 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	Inclution of Food Insecurity Experience Scale(FIES) Module to the household income and expenditure Survey(HIES) සමීක්ෂණය සඳහා	105	255	255	100%
2	සෞඛ්‍ය අමාත්‍යාංශය	STEP Survey 2020 සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු සඳහා	11,743	11,743	9,388	79.94%
3	රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිධාරී දීමනා සඳහා	40	120	120	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	1,184,910	1,184,910	නැත	100%
9152	යන්ත්‍රෝපකරණ	542,934	542,934		
9153	ඉඩම්	1,186,811	1,186,811		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. TPD/D/DCS/2/21/14 | ඔබේ අංකය / உமது இல. / Your No | දිනය / திகதி / Date 2022 මුනි 28 දින

ගණන්දීමේ නිලධාරී
ජනාලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්සේරුකරණයේ සීමා මායිම

ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා ඊට අදාළ ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන යටතේ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වැවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මිංගේ රධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන කවම මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳව මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් පෙරිම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විත්තරාවර්ජන කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම වැවස්ථාවේ 154(6) වගවිස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1.6 අත්දැකීම් දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එම මූල්‍ය

+94 11 2 35 50 28 - 34 +94 11 2 35 52 99 auditorgeneral.gov.lk www.naod.gov.lk

කාර්යයාධිකාරය හා මූල්‍ය පුවරුව ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇත්තේ නම් එම ප්‍රකාශය මගින් ඒ බව ප්‍රකාශ කළ යුතු බවත් දක්වා ඇත.

1.2 **සක්‍රීයකාරණය කළ මිනුම සඳහා පදනම**

මෙම ඡේදයේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මිනුම් පදනමට මාගේ මිනුම තක්සේරුකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. එමඟින් විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම් යන කොටසේ තවදුරටත් දීක්වෙන් කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වැනි කාර්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සකස් හා සාධාරණ තත්ත්වයෙන් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන සිදුකෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන සිදුකෙරෙන නිරීක්ෂණ හා විචාර සහ වැරදි හේතුවෙන් දැනී වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන්තොරව මූල්‍ය ප්‍රකාශන සිදුකෙරෙන නිරීක්ෂණ හැකි වන සේ අවශ්‍ය අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජනාලේඛන හා සංවිධානලේඛන අදාළ කාර්තාවිෂ්කාරයන්තුට පිපිනා වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන සිදුකෙරෙන නිරීක්ෂණ කැනිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජනාලේඛන හා සංවිධානලේඛනා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සවිලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සෑහීමට වීය යුතු අතර එම පද්ධතියේ සවිලදායීත්වය පිළිබඳව නලියේ කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය පවසන්නටද සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධ විගණකගේ වගකීම**

අපේක්ෂාවන් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් පැනිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකයක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත්ව විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක කාවැද්දෙ ප්‍රකාශයෙන් අදහස්වරණය කර ගන්නා හිඩැස් වන තත්ත්වයක් ඇතාවනු ඇත. වංචා සහ වැරදි නැති හෝ සාපූර්ණ ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක යාවැදෙ ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක සාරය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වැන්තීය විනිශ්චය සහ වෘත්තීය සැකෙප්ටිසිස්වාදී ආකල්ප ක්‍රියාත්මක කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වැන්නේ ඒවා දුස්සන්ධානයෙන්. වාසි ලේඛන ගෑනකීමෙන්, ඒතනාන්විත මඟහැරීම්වලින්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා ඒවා බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවුවද, අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සිණිය අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- ගණකාදරව කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වලංගුභාවය සහ අන්තර්ගතය සඳහා සාධක වූ තොරතුරු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත්තීම.
- මූල්‍ය ප්‍රකාශනවල විදූහාභාවය හා අන්තර්ගතය සඳහා සාධක වූ තොරතුරු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ ගණකාදරව කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධ දේදිරිහන් කිරීම් ඇගයා ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන අසාධාරණතා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අඟහරුත් කරුණු පිළිබඳව ගණකාධිපති නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් ආගණනික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ රාජිත විගණන පනතේ 6(1)(ඉ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(ඩ) මූල්‍ය ප්‍රකාශන ඉතුරුම් වර්ෂය සඳහා සකුරුපවන බව,

(ත) ඉතුරුම් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය මූල්‍යමය කළමනාකරණ චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වෙනත් ආයතන සඳහා ගෙවීම් නිලධාරීන් වෙතුවෙන් රැස්කර තිබුණු ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් නොකළ යුතු අතර, එය අනිවාර්ය සංසදීම ප්‍රකාශයේ හැලැහිය යුතුව තිබුණි. එම උපදෙස්වලට පටහැනිව වෙනත් ආයතන ගෙවීම් නිලධාරීන් වෙතුවෙන් රැස්කළ එකතුව රු.55,214,269 ක ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් ශේෂ සටහන දක්වා තිබුණු අතර, අනිවාර්ය සංසදීම ප්‍රකාශයේ දක්වා නොතිබුණි. මේ නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.55,214,269 කින් වැඩිපයක් දක්වා තිබුණි.

(ආ) ඉහත කාරණයේ සඳහන් ඡේදයේ 7.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය අනිවාර්ය සංසදීම ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය සංසදීම ශේෂය සමඟ සැසඳ විට 2021 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය සංසදීම ශේෂයට සමාන විය යුතුව තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය ධනාත්මක (-) රු.23,937,125 ක අනිවාර්ය සංසදීම ප්‍රකාශයෙන් ලැබෙන ඍණ (-) රු.23,937,125 ක සැලැසුම් පසුව 2021 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය ශේෂය 0 ක් වේ. නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය ශේෂය රු.1,486,732 ක් ලෙස දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය සත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(අ) ගිණුම් නොවෙන වත්කම්

(i) මුදල් නෙරපුලාසි 770(2) ප්‍රකාරව අපහරණය කිරීමට නියමිත නිමයන්ත්‍ර උපාංග වටිනාකම් රු.207,683 ක් වූ වත්කම් SA 82 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කර තිබුණි.

(ii) 2020 දෙසැම්බර් 31 දිනට සිදු කළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී විකුණා දැමීමට නිර්දේශ කර තිබුණු රු.1,907,417 ක වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් සඳහන් මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් කළ යුතුව තිබුණි. නමුත් 2022 මාර්තු 25 දින වන විටත් එම වත්කම් විකුණා නොමැතිණි.

(iii) නායකත්ව දෙකක් වසින් දෙපාර්තමේන්තුව පවත 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී ලබා දී තිබුණු එකතුව රු.5,457,819 ක් වටිනා ෙහෙල් ෙහැල්මට් 12 ක්, වැස්ස පරිහරණය 55 ක්, ෙතාට්ටුණ් පරිහරණය 04 ක්, ෙලදර් ෂූස්ටර් 02 ක්, ජැකට්ටුවලින් ත්‍රිත්වරයක්, කමස්වලට පරිහරණය 04 ක් හා කලර් ෆින්වරුයක් ලැබී තිබුණි. එම වස්තුව 2021 දෙසැම්බර් 31 දින වන විටත් මූලය ප්‍රකාශනවල මූල්‍ය ගනුවන වස්තුව ලෙස ඇතුළත් කර තෙතිබුණි. එමෙන්ම එම ආයතන ෙවත වසින් එම කාල පරිච්ඡේදයේදී ලබා දී තිබුණු ෙසවිලැන් ෙවබ් පරිහරණය 70 ක්, ෂින්ෂ්පැඩ් ලැප්ටොප් 10 ක් හා වයිපර් රවුටර් 10 ක වටිනාකම් තක්ෙසේරු කර සම්ෙලෝචිත වර්ෂය අවසන් වන විටත් මූලය ප්‍රකාශනවල මූල්‍ය ගනුවන වස්තුව ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(iv) 2021 ෙනෝවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය මුදල් ෙදපාර්තමේන්තුවේ වාර්තාවේදීමේ 7.2 ඡේදය ප්‍රකාරව ෙදපාර්තමේන්තුව වසින් භාණ්ඩාගාරය වවන අප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූලය සත්ත්වය පිළිබඳ ප්‍රකාශෙය් ඉදල් හා මුදල්වලට පමණක් දැ ඒ ශේෂයට ඇතුළත් ෙතාකළ යුතුව තිබුණි. නමුත් මූලය සත්ත්වය පිලිබඳ ප්‍රකාශෙය් ෙදපාර්තමේන්තුව වසින් භාණ්ඩාගාරයට අප්‍රේෂණය කර තිබුණු රු.1,486,732 ක මුදල් ශේෂය, මුදල් හා මුදල්වලට යටත ෙදේ ලෙය දක්වා තිබුණි.

1.6.3 අවුරුදු ගැලපුම් ශේෂය

2021 දෙසැම්බර් 30 දිනැති අංක SA/MAA/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ෙග් ලිපිය මඟින් 2021 වර්ෂය සඳහා මූලය ප්‍රකාශන සකස් කිරීමට අදාල ACA – 6 හා ACA – 7 ආකෘති සංශෝධනය කර තිබුණි. 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය සෘණ (-) රු.23,937,125 ක් වී තිබුණි. සංශෝධිත ACA 7 ආකෘතියේ සඳහන් අවුරුදු ගැලපුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අවුරුදු ගැලපුම් ශේෂය සෘණ (-) රු. 23,937,125 ක් වී තිබුණි. එම ශේෂය මූලය කාර්යසාධන ප්‍රකාශෙය් අවුරුදු ශේෂය සමඟ ගැලපූ විට සෘණ (-) රු.47,874,250 ක් වේ. නමුත් අවුරුදු ගැලපුම් ශේෂය ධන (+) රු.23,937,135 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත ACA 7 ආකෘතිය නිවැරදි ෙලස ඉදිරිපත් ෙනොකර තිබීම නිසා මූලය කාර්යසාධන ප්‍රකාශෙය් දක්වා ඇති සවස්ත් අනුව අවුරුදු ගිණුෙම් ශේෂය ශුන්‍ය වශෙයන් ෙලස ගාවිතය ෙදස ඉදිරිපත් ව ෙනොතිබුණි.

2. මූලික සම්මාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත යඳහන් නිරීක්ෂණයන් කරුණු දැක්වේ.

(අ) ප්‍රතිපාදන නිෂ්ඵලවීම

වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.93,090,000 ක ප්‍රතිපාදනවලින් සම්මාලෝචිත වර්ෂයේ කිසිදු උපයෝජනයක් නොකර එය මුදල්මණ්ඩලයට ඉතිරි කර තිබුණි.

(ආ) අධිප්‍රතිපාදන සලසා ගැනීම

වැය විෂයයන් 23 ක එකතුව රු. 2,120,027,667 ක අධිප්‍රතිපාදන සලසා ගැනීම හිතා යම්මාලෝචිත වර්ෂය තවයන් එන විට ඉන් එකතුව රු. 317,475,349 ක ප්‍රතිපාදන උපයෝජනය කර නිබුණි. ඒ අනුව එකතුව රු. 1,802,552,318 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය එක් එක් වැය විෂය මෙතුලවන් සලසා තිබුණු ඉල්ලීම් ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

2.2 රජයේ නිලධාරීන්ට ණය්කිකරම් ගිණුම

2.2.1 අවම ලැබීම් සීමාවට ළඟා නොවීම

2020 අංක 7 දරන විපර්යාස පනතේ හඳුන්වා දෙන ලද උපලේඛනයේ සඳහන් රජයේ ඵත්තිකරම් කාර්යයන් වෙනුවෙන් සීමාවන් පනවා තිබුණි. විෂය අංක 25201 ණයලේඛන හා සංවිත කළමනාකරණ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ට ඵත්තිකාරම් කාර්ය වෙනුවෙන් අවම සීමාව ලෙස රු.38,000,000 ක් දක්වා තිබුණි. සම්මාලෝචිත වර්ෂය අවසන් වන විට පරිය ලැබීම් රු.35,462,404 ක් වී තිබුණි. ඒ අනුව රු.2,537,596 කින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි. වගකීම භාර නිලධාරියා මූල්‍ය කළමනාකරණ පද්ධතියේ විධිවිධාන උල්ලංඝනය කර එම සීමාව ඉක්මවා ණය ලබා දී තිබුණි. 2022 මැයි 31 දින වන විට එම සීමාවන් සංශෝධනය කර කාර්යාලයේ අනුමැතිය ලබා ගත් බව නගරාධිපති කාර්යාලයට දැනුම් දීමක් කර තොතිබුණි.

2.2.2 ඔහුකිරි ණය ශේෂ පැහැර හැරීම

දෙපාර්තමේන්තුවෙන් විටින් විට ස්ථාන මාරු වී ගිය, ඉවත්වය පසුගිය, මිය ගිය/ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් සම්මාලෝචිත වර්ෂය අවසානයට පැවති ණය ශේෂයෙන් රු. 265,087ක් පෙවත් සියයට 18 ක් වර්ෂ 05ට වැඩි කාලය සිට පැවැත එන ණය ශේෂ වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත යඳහන් නිරීක්ෂණයන් කරුණු දැක්වේ.

(අ) මිය ගිය නිලධාරීන් හඳුන් දෙපොකුට අදාළව් අය විය යුතු ණය ශේෂයෙන්ගෙන් එකතුව රු.379,856ක් විය. 2022 වර්ෂයේ දී ඉහත නිල වැටුපෙන්ගෙන් රු.221,206 ක්

දැයකරගෙන තිබුණි. 2018 වර්ෂයේ දී ඒයගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.65,900ක මුදල් වරඳ පරිපෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කරන ලිව 2018 වර්ෂයේ පිට වීගෙයනය වෙතු දක්වා තිබූ හානීන් සම්බාලෝචන වර්ෂය අවසාන වන විටත් එම මුදල් අයකර ගතත නොහිටිණි.

(ආ) 1991 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ සේවය හැර ගිය නිලධාරීන් රජයෙලොත් වෙතෙකුට් පදාළව එකතුව රු.524,261 ක මුය ශේෂ නිගමිවිව පැවැත එමිත් තිබුණි. එම මුය ශේෂ සම්බාලෝචන වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අදාළ්ත්මෙන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2020 හා 2021 වර්ෂවල දී විශ්‍රාම ගිය නිලධාරීන් සය පදනනකුගෙන් එකතුව රු.592,361 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට ලැපතර ගෙනීමට අදාළ්ත්මෙන්තුවක් ව තිබුණ අතර එයින් රු. 509,771 ක් 2022 වර්ෂයේ දී අයකරගනනා තිබුණි.

(ඈ) සේවය හැර ගිය නිලධාරියාගෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු. 17,050 ක මුය ඉණිමය හා සෙළඹිය අයවීමට තිබුණු ලකර මහු විසින් කරන ලද ඉල්ලීමකට අනුව රු.3,000 බැගින් වූ වාරික දොළහකින් ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණ ද, 2021 වර්ෂයේදී කිසිදු වාරිකයක් අයකර ගනත නොහිටිණි.

2.3 බැංකු ගිණුම් මේඛනෙයරීම්

2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ඉෙරීම් පඳහා ඉදිරිවත් නොකළ චෙක්පත්වල එකතුව රු.71,269,682 ක් තිබුණි. එම චෙක්පත් තුළ නිකුත් කර බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.263,542 ක චෙක්පත් 12 ක් පතිඵාන්ධයෙන් සම්බාලෝචිත වර්ෂය අවසන් වන විටත් පුදල් රෙගුලාසි 396(ඇ) පුකාරව කටයුතු කර නොහිටිණි.

2.4 නිෂ්ක්‍රීය වූ වත්කම්

2014 දෙසැම්බර් 29 දින මෙහෙයුම්ගලීන සම්පාදේකින් රු. 16,320,304 කට 10 KVA යන්ත්‍ර 06, 20 KVA යන්ත්‍ර 6, 30 KVA යන්ත්‍ර 05 ක් හා 40 KVA යන්ත්‍රයක් වශයෙන් යන්ත්‍ර 18ක් මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍ර හෙෂ්ඨාධිකාරී පරීක්ෂා කිරීමේ දී 2014 දෙසැම්බර් 29 දින මිලදී ගත් දින සිටම 15 KVA යන්ත්‍රයන් 07 වන විටගේ විවිධ කොටස්වල නිෂ්ක්‍රීයව් පැවැතුණි.

3. ගම්‍යතාවූම් ප්‍රමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා ගම්‍යතාවය

කාලීනවූත් නිවැරදිවූත් දත්ත ලබාගැනීම මූලික වශයෙන් රටවල් දේශයේ යම්කිසි ආර්ථික ඒ-ආර්ථිකයෙහි දායකවීම දෙපාර්ශ්වයෙන්ම අවශ්‍යවන වගඋත්තරකම් දන්වා සිටුණි. ඒදපාර්තමේන්තුව විසින් වෙත් අඩවියට හා මුද්‍රණය කර දත්ත නිකුත් කිරීම සිදු කරනු ලබයි. එම දත්ත නිකුත් කරීම සඳහා දින දර්ශනයක් සිළියෙල කර තිබුණි. එම දින දර්ශනය අනුව යම්කාලෝචිත වර්ෂයේදී දත්ත වාර්තා 62 ක් පමණ අඩවියට නිකුත් කල යුතුව තිබුණි අතර, දත්ත වාර්තා 23 ක් මුද්‍රණය කර නිකුත් කල යුතුව තිබුණි. එම වාර්තා දින දර්ශනයේ සඳහන් කාලච්ඡේදවලට පසු නිකුත් කළ යුතුව තිබුණත්, එම වාර්තාවලින් කිසිදු වාර්තාවක් නියමිත දිනවලදී නිකුත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය: වාර්තා නිකුත් කිරීම තාය 01 සිට තාය 11 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සිදු වී තිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අනුවර්තීවත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සැකසීමේදී ප්‍රධානතාව සැලැස්මේ සඳහන් අංශ 06 ක් විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් 11 ක ඉටු කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවූම් අවස්ථාවේ ලබා නොගැනීම

ගණකාධිපති කාර්යසාධන වාර්තාව අනුව සැලැස්මෙහි ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත නිමැවුම් අවස්ථාවේ දෙපාර්ශවයෙන්ම සංඛ්‍යා 12 කින් ළඟා කර ගෙන නොතිබුණි. කාර්යයන් ඉටු නිරීමෙ ප්‍රගතිය ශියයට 10 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක පැවැතුණි.

3.2 මානව පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 10 දිනැති අංක 2/2015 යටතේ මුදල් පනතේ 12 වන්ඩය ප්‍රකාරව 2018 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු වාහන 04 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු ගණාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි.

(ඇ) ක්‍රි.ශ. 1647 (සෑ) පසිදි වාගන ද ඒවායේ උපකරණ ද පිළිබඳ සවිස්තරාත්මක සමීක්ෂණයක් පැවැත්විය යුතු වූවත්. දෙපාර්තමේන්තුවේ වාහන සහ ඒවායේ උපකරණ පිළිබඳව 2020 වර්ෂයේ දී එවැනි සමීක්ෂණයක් සිදුකර නොනිබුණි.

(ඈ) අනුයුක්ත කළ නිල වාහන සම්බන්ධව ඇති නිලධාරීන්ගේ රාජකාරීමය කටයුතු සඳහා රියැදුරු අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීමට අදාළ විෂ්කර 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 3 ඡේදය පසිදි ඇතිකරුම 1 හි ආකාරයට සවිහත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ නිල රථ සඳහා ඒ අනුව සටහන් කර නොතිබිණි.

(ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව දක්වා ඇති ආකෘතිය පසිදි වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදුකළ දින සිට පාවිච්චි කළ ඉන්ධන ප්‍රමාණය සහ පසු ගිය වාරයේ දී ගෙට්ටුව පූර්ව ඉන්ධන ප්‍රමාණය දැන ගැනීමට හැකිවන පසිදි වාහන පිළිබඳ සටහන් පවත්වා ගෙන යොතිබිණි.

(ඊ) මුදල් රෙගුලාසි 1647(ඇ) පසිදි එක් ස්ථානයක වාහන කුනක් හෝ ඊට වැඩි ගණනක් ඇති විටදී කල් පහතවත්නා වූව ද , දෙපාර්තමේන්තු සටහන් තනාකරනු ලබන්නා වූ ද, සියලුම දුවිය මිල දී ගැනීම් හා නිකුත් කිරීම් පිළිබඳ රල්හිනයක් පවත්වාගෙන යා යුතු වූව ද, එවැනි ලේඛනයක් ප්‍රවාහන අංශයේ පවත්වා නොගිබුණි.

(උ) 2016 දෙසැම්බර් 29 දින අංක 30/2016 රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ වක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහන 24 ක පලයේ යවහන් අනුව නිසි දිනෙක ඉන්ධන පරීක්ෂාව සිදුකර ගෙන නොතිබුණි. එහෙත 08 ක 2003 වර්ෂයෙදිද, තවත් වාහනයක් 2004 වර්ෂයෙන්දී ඩිදු කර නිබිණි.

3.3 **රජයේ නිලධාරීන් ඇප කැමිම**

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව මෙම්ගේන් අත්සන් කිරීමට බලය පවරා ලද නිලධාරීන් 06 දෙනෙකුගෙන් ඇප කැන්පත් ලබා නොගිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා සථාය කාර්ය මණ්ඩලය

2021 දෙසැම්බර් 31 දිනට අනුමත, සථාය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ

මෙවිසෙ විර්ගය	අනුමත මෙවිසෙ සංඛ්‍යාව	සථාය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ඡොෂ්ඨ විධායක	305	201	104
තෘතීයික මට්ටම	595	464	131
ද්විතීයික මට්ටම	613	462	151
ප්‍රාථමික මට්ටම	179	143	36
තවකස්/සහියම්/තාවකාලික			
උහසිධාරී අභොයලාඒ	0	9**	0
රියදුරු (රහිය)	3	0	3
කාර්යල කම්කරු	3	0	3
එකතුව	**1,698**	**1,279**	**428**

2021දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් සතපුරු 428ක් හපවන් සියයට 25ක් පුරප්පාඩුව පැවැතුණි. එම පුරප්පාඩුවලින් සතපුරු 151ක් හගවන් සියයට 35ක් ද්විතීයික මට්ටමේ නිලධාරීන්ගේ සතපුරු විය.

ඩී.ඒ.ඩී. මණිහංස්කර
ජෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වාර්ෂිකව ආයතනයේ අපේක්ෂිත නිමැවුම හා එහි ප්‍රගතිය මැනිය හැකි කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇත. පසුගිය වසරට අදාලව එම දර්ශකවල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	89% - 75%	74% - 50%
1	දළ දේශීය නිෂ්පාදිතය (GDP) ඇතුළු සාර්ව ආර්ථික දර්ශක දෙපාර්තමේන්තුවේ දත්ත නිකුත් කිරීමේ කැලැන්ඩරයට අනුව ප්‍රකාශයට පත් කිරීම	100	-	-
2	ශ්‍රම වෙළඳපල දර්ශක (රැකියා නියුක්තිය හා රැකියා වියුක්තිය) විශේෂ දත්ත ප්‍රකාශයට පත්කිරීමේ සම්මතයන්ට අනුව ප්‍රකාශයට පත් කිරීම	100	-	-
3	ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව අදාළ කටයුතු සිදුකිරීම	96	-	-

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශය මගින් පසුගිය වසර තුල සිදු කරන ලද කාර්යයන් මත පදනම්ව ගණනය කරන ලද කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය පහත දක්වා ඇත.

01 අංශය

අනු අංකය	විශේෂිත දර්ශක (ක්‍රියාකාරකම්)	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස නිමවුම තත්‍ය		
		100% - 90%	89% - 75%	74% - 50%
	ජන හා නිවාස සංගණනය (CPH) - 2021 සැලසුම් කටයුතු			
I	**පූර්ව පරීක්ෂාව -පරිගණක ආශ්‍රිත පුද්ගලික සම්මුඛ පරීක්ෂණ (CAPI)**			
a).	පූර්ව පරීක්ෂාව - පුහුණුව	_	_	_
b).	පූර්ව පරීක්ෂාව -ක්ෂේත්‍ර කටයුතු	_	_	_
c).	CAPI වැඩසටහනෙහි සහ ක්‍රමවේදයේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම	_	_	_
II	**සංගණන කාණ්ඩ රෙජිස්ටරය (MRCB) දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම**			
a).	සංගණන කාණ්ඩ පිළිබඳ විස්තර	100		

	තහවුරු කිරීම			
b).	සංගණන කවයන් වෙන් කිරීම සහ තහවුරු කිරීම.	100		
III	**ලැයිස්තුගත කිරීමේ අදියර - ජන හා නිවාස සංගණනය 2021**			
a).	උපදෙස් අත්පොත් සහ වෙනත් අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම, පරීක්ෂා කිරීම, සෝදුපත් කියවීම සහ මුද්‍රණය	100		
b).	සංගණන තොරතුරු කාඩ්පත මුද්‍රණය කිරීම (CCI)	100		
c).	සංගණන ලේබල් මුද්‍රණය කිරීම (රතු ලේබල්)	100		
d)	සියලුම දිස්ත්‍රික්ක වෙත උපදෙස් අත්පොත්, ආකෘති පත්‍ර, අනෙකුත් ලේඛන සහ අනෙකුත් උපකරණ බෙදා හැරීම	100		
e)	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (DCS) ප්‍රධාන කාර්යාල නිලධාරීන් සහ දිස්ත්‍රික් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම	100		
f)	පුහුණුකරුවන් පුහුණු කිරීම - ලැයිස්තුගත කිරීමේ අදියර	–	–	–
IV	**e- සංගණනය**			
a).	e- සංගණනයේ මූලික කටයුතු	100		
b).	e- සංගණනය සඳහා ලියාපදිංචි වීම	–	–	–
V	**දත්ත අධීක්ෂණය සහ සැකසීම**			
a).	ආධාරක දත්ත සමුදායන් වැඩි දියුණු කිරීම	100		
VI	**ප්‍රචාරණය**			
a).	මුද්‍රිත මාධ්‍ය හරහා සංගණන ප්‍රචාරණය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම -ස්ටිකර් , පෝස්ටර්, ප්‍රවෘත්ති පත්‍ර ලිපි ආදිය	100		
b).	ඩිජිටල් මාධ්‍ය - වීඩියෝ, රූපවාහිනී සහ ගුවන් විදුලි දැන්වීම්, සමාජ මාධ්‍ය ආදිය හරහා ප්‍රචාරණය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම	100		
c)	සංගණනයේ 150 වන සංවත්සරය සැමරීම සඳහා සමරු කාසියක් නිකුත් කිරීමේ කටයුතු සැලසුම් කිරීම	100		
VII	**ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම**			
A.	**බැඳීම් (2020 සිට)**			
a).	ටැබ්ලට් පරිගණක ප්‍රසම්පාදනය (1,000)	100		
b).	අනෙකුත් පරිගණක උපාංග මිලදී ගැනීම	100		

